# හොඳම යහළුවන් වෙමු



ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්ව

උත්සාහයෙන් වීර්යයෙන් ජීවිතය ජයගන්නට
වෙර දරනා පින්වන්ත දූ පුතුන් උදෙසා...

ශ්‍රී බුද්ධ වර්ෂ 2560
ව්‍යවහාරික වර්ෂ 2016
ඔක්තෝබර්, නොවැම්බර්, දෙසැම්බර්

ඇතුළු පිටු -
- මට්ටකුණ්ඩලී කුමරුගේ කථා වස්තුව
- සෙනෙහෙබර ආමන්ත්‍රණය
- නිර්මාණ ඉසව්ව
- පුණ්‍යක්‍රියා


Web : www.shraddha.lk
Email : charity@shraddha.lk
Find us on Facebook www.facebook.com/ShraddhaTv
YouTube www.youtube.com/ShraddhaTv
www.google.com/+ShraddhaTV
www.twitter.com/ShraddhaTV

ශිෂ්‍යත්වලාභී පින්වත් දියණියක් විසින් එවා තිබූ සිතුවමක්...



මහා කාරුණික වූ ප්‍රඥාවෙන් අග්‍රේෂ්වර වූ සියලු දෙව් මිනිසුන් හට විමුක්තියේ මාර්ගය විවර කළ ශ්‍රීමත් සුගත තථාගත ගෞතම සම්මා සම්බුදුරජාණන් වහන්සේට අපගේ නමස්කාරය වේවා !



මහමෙව්නාව භාවනා අසපු සංචිතයේත්, ශ්‍රද්ධා රූපවාහිනියේත්
ශ්‍රද්ධා ගුවන්විදුලියේත්, නිර්මාතෘවර, ප්‍රධාන අනුශාසක
අතිපූජනීය කිරිබත්ගොඩ ඤාණානන්ද ස්වාමීන් වහන්සේ.

**ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්ව පුණ්‍ය ව්‍යාපෘතිය සඳහා සෙනෙහසින් අවවාද අනුශාසනා කරමින් අපහට නිරතුරු මඟ පෙන්වන අපගේ ගුරුදේවෝත්තම කල්‍යාණ මිත්‍ර පින්වත් ලොකු ස්වාමීන් වහන්සේට අපගේ නමස්කාරය වේවා !**

ශ්‍රද්ධා රූපවාහිනිය
369, හේවාගම, කඩුවෙල.
දුරකථන : 0112 571 471
ෆැක්ස් : 0112 548 400
ඊ මේල් : info@shraddha.lk
වෙබ් : www.shraddha.lk

රූපවාහිනිය

මහමෙව්නාව
භාවනා අසපුව

ගුවන්විදුලිය

අනේක දුක් කම්කටොලු මැද
උපයාගත් මුදල් තුටු සිතින් ම
ජීවිතය ජයගන්නට වෙර දරන
දැයේ දුවා දරුවන්ට
මහත් සෙනෙහසින් දයාද කරන
දයාබර කැපකරු මා පියවරුන් සියලු දෙනා ද
අනේක දුක් කම්කටොලු මැද
ගුණයෙන් නුවණින් පිරිපුන් අනාගතයකට
පෙරමං තනන ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්වලාභී
පින්වත් දරුවන් සියලු දෙනා ද
නිදුක් වෙත්වා ! නීරෝගී වෙත්වා ! සුවපත් වෙත්වා !
මේ දුර්ලභව ලද මිනිස් ජීවිතය
නිමවන්නට මත්තෙන් ඉතා සුවසේ ම
උතුම් චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කොට
මේ දුක්ඛිත සසර ගමනින්
නිදහස් වීමේ වාසනාව ලබත්වා!

අළුදෙණියේ සුබෝධි ස්වාමීන් වහන්සේ.
ව්‍යවහාරික වර්ෂ 2016ක් වූ ඔක්තෝම්බර් මස 07 වැනි දින දී ය.

නමෝ බුද්ධාය !!!

දයාබර දුවේ පුතේ,

තරගය, ජය වගේ ම පරාජය කියන දේවල් ඔබට අපට නුහුරු නුපුරුදු දේවල් නො වෙයි. පුංචි හිත්වලට බරපතළ කාරණාවක් වගේ පෙනුනත් මේ කාරණය අපි දැන් ම හිත්වල දරාගෙන පුරුදු කරගෙන ඉන්න එක මුළුමහත් ජීවිත කාලයක් පුරා ලොකු සුවපහසුවක් අත්පත් කර ගන්නට උපකාරයක් වේවි.

අපේ අධ්‍යාපන ක්‍රමය තුළ පළමුවෙනියා, දෙවෙනියා වීමේ වගේ ම විභාග උසස් ලෙස සමත්වීමේ දැඩි අවශ්‍යතාවයක් තිබෙනවා. ඉගෙන ගන්න දරුවන්ගේ හිත්වලට මේ අදහස ඇතුළු කරන දෙමව්පිය, ගුරුවර, වැඩිහිටියන්ගේත් ප්‍රධාන අපේක්ෂාවක් තමයි ඔයාලා ඉහළ ම සමත්කමත් ඇතිව ඉලක්ක ජය ගන්නවා දැකීම. ඒ වුණත් එවැනි කාරණාවල දී එක් ජයග්‍රාහකයෙක් බිහි වෙන්නේ ඒ කෙනාට සාපේක්ෂ ව අනිත් අය පරාජිතයන් කරලයි.

දුවේ පුතේ, තව මාස දෙකකින් ඔයාලා මේ අධ්‍යාපන වර්ෂයේ දැනුම උරගා බලන විභාගවලට මුහුණ දෙනවා. ඔබ අතරින් පිරිසක් අතිශය තරගකාරී සාමාන්‍ය පෙළ විභාගයටත් මුහුණ දෙනවා. ඒ සියල්ල අතිශය සාර්ථක ව නිමා කරලා, බොහොම හොඳ ප්‍රතිඵල ලබන්න අපේක්ෂාවක් ඔබට ඇති. ඒ අපේක්ෂාවන් මල්ඵල ගැන්වේවා කියා අපත් මෙත් සිතින් ආශීර්වාද කරනවා.

දුවේ පුතේ, මේ තරගයන් සියල්ල ම බොහොම තාවකාලිකයි. ජය, පරාජයනුත් එසේ ම යි. ඒ හැම දෙය ම තාවකාලික දේවල් ම වූ නිසාවෙන් තමයි එක තරගයක් අවසානයේ අපට විවේකයක් වෙනුවට තවත් තරගයක් ම මුණගැසෙන්නේ පන්තියේ වාර විභාග, ශිෂ්‍යත්ව විභාගය, සාමාන්‍ය පෙළ, උසස් පෙළ, විශ්වවිද්‍යාලයේ විභාග. මේ විදිහට එකින් එක අධ්‍යාපනික කඩයිම් අපේ ජීවිත තුළ ගොඩනැගෙනවා. ඒ අතරතුර ම ගෘහ ජීවිතයක් තුළ බැඳී සිටින යුතුකම්, වගකීම් සම්භාරයකුත් ටිකෙන් ටික බරින් වැඩි වෙමින් ඔබේ ජීවිත කරා එනවා. ඒ සියල්ල තුළ ඔබ සිතූ පැතූ අයුරින් ම සාර්ථකත්වය අත්පත් නො වන්නටත් පුළුවනි. එවන් මොහොතක කලකිරීම්, පසුතැවීම්, දුක් සෝ සුසුම් හට ගැනීම් ආදිය තමයි සාමාන්‍ය ලෝකය තුළ ප්‍රකට වන්නේ.

එවන් ස්වභාවයන් ප්‍රකට ලෝකයක සම්බුද්ධ ශ්‍රාවකයෙක් විදිහට වෙනස් ආරක චරිත ස්වභාවයන් ඇති කර ගැනීමේ හැකියාවත්, වුවමනාවත් අප සතු විය යුතු ම යි. දුවේ පුතේ, ජයග්‍රහණයක දී උදම් වන්නට ඒ කිසිදු ජයග්‍රහණයක් සදාකාලික නැහැ. හැරත් අප සසරේ දිගු කාලයක් ම පරාජිතයන් ම පමණයි. එනිසයි කෙළවරක් නො දැක ම අප මේ ගමනේ යෙදෙන්නේ. පරාජයක දී ශෝක කරන්නට ඒ පරාජයන් ද සදාකාලික නැහැ. සියලු පරාජයන් ඉක්මවා ගිය අපරාජිත මුනිවරු වැඩ සිටි සම්බුදු සසුනේ ඉතිහාසය අපි දන්නවා. එනිසා, තරග වැදී ජය හෝ පරාජය හෝ දැක කම්පා වීම වෙනුවට ඒ සියල්ලෙන් නිදහස් වන ඒකායන ගමන් මඟ තුළ පිළිවෙත් පුරන්නට අප කැමති විය යුතුයි.

සිතූ දෙය නොමවන, නො සිතූ දෙය ම සිදුවන සසර ස්වභාවය තුළ අප නිසැක ජය ලැබුවා වන්නේ මේ සිත ජය ගත් දවසටයි. නිරන්තරයෙන් කැළඹෙන ඒ සිත දමනයට යි සම්බුදුරජාණන්

වහන්සේ ශ්‍රාවකයන් ව හික්මවන්නේ. ඔබේ ජීවිත තුළ පුරුදු කෙරෙන, දියුණු කෙරෙන පුංචි ගුණධර්මයේ පටන් උපකාරය ලැබෙන්නේ සිත දමනයට යි. ඒ නිසා, ඔබත් මේ තාවකාලික තරඟ දිනන්නට යම් වෙහෙසක් දරනවා නම් සිත රැක ගන්නත්, සිත දමනය කරන්නත් ඒ වගේ ලක්ෂ කෝටි සංඛ්‍යාත වෙහෙසක්, උනන්දුවක් ඇති කර ගත යුතු වනවා. එය පහසු නැහැ. දුෂ්කරයි. ඒ දුෂ්කර දේ කළවුන් තමයි ලෝකයේ අපරාජිතයන් ලෙස අමා මහ නිවන සාක්ෂාත් කළේ අතිශයින් විරල සම්බුද්ධ ශාසනයක ශ්‍රාවකයන් වීමේ වාසනාව ලැබූ පින්වන්ත ඔබට මේ ජීවිතයේ සාර්ථකත්වය වෙත යන අතරේ ම සසර මග ඒකාන්ත විජයග්‍රහණය සනිටුහන් කිරීම උදෙසා ගුණධර්මයෙන් ද වැඩෙන්නට උතුම් තෙරුවනේ ආශීර්වාදය සැලසේවා!

ඔබට තෙරුවන් සරණයි!
මෙයට,
ගෞතම බුදු සසුන තුළ
මෙත් සිතින්,
අළුදෙණියේ සුබෝධි ස්වාමීන් වහන්සේ.
ශ්‍රද්ධා රූපවාහිනිය - ශ්‍රද්ධා ගුවන්විදුලිය.

# පටුන


01. මට්ටකුණ්ඩලී කුමරුගේ කථා වස්තුව 12

02. සෙනෙහෙබර ආමන්ත්‍රණය 16

03. නිර්මාණ ඉසව්ව 21

04. හොඳම යහළුවන් වෙමු 22

05. පුණ්‍යක්‍රියා 30

අමා දම් රස වෑහෙන විස්තරාර්ථ

# ධම්ම පදය

(යමක වර්ගය)


**පූජ්‍ය කිරිබත්ගොඩ ඤාණානන්ද
ස්වාමීන් වහන්සේ**

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මාසම්බුද්ධස්ස
**ඒ භාග්‍යවත් අරහත් සම්මා සම්බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා!**

## 2 ගාථා රත්නය

# මට්ටකුණ්ඩලී කුමරුගේ කථා වස්තුව

### "පිනක් කළෝතින් සැපමයි ලැබෙන්නේ"

පින්වතුනේ, පින්වත් දරුවනේ, අපේ බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර වැඩසිටින කාලයේ අදින්නපුබ්බක නමින් ඉතාම ලෝභ තාත්තා කෙනෙක් හිටියා. එයාගේ එකම පුතාගේ නම මට්ටකුණ්ඩලී. ඒ පුතාට කනේ පළඳින ආභරණ සාප්පුවෙන් ගත්තේ නැහැ. ඒ තාත්තා මොකද කළේ? රන් කැබලි දෙකක් තමන්ම තලලා කරාබු ජෝඩුවක් හදලා පුතාගේ කනේ පැළඳුවා. ඒ නිසා තමයි පුතාට මට්ටකුණ්ඩලී යන නම ලැබුණේ.

පවුලේ කාටවත් කෑම බීමවත් හරියකට ලැබුණේ නැහැ. අන්තිමේදී මේ දරුවාට පාණ්ඩු රෝගය හැදුණා. මුදල් වියදම් වෙන ලෝභයට අදින්නපුබ්බක, වෙදමහත්වරු ළඟට ගිහින් කතා බස් කරමින් සිටිනා අතරේ "මී... මී.... වෙද මහත්තයෝ පාණ්ඩු රෝග යක් හැදුනොත් මොන වගේ බෙහෙතක්ද හොඳ?" කියලා අහනවා. වෙද මහත්තුරු දැනගත්තා මෙයා කරන්නේ කපටිකම බව. ලෙඩේ වැඩි වෙන බෙහෙත් කිව්වා. අදින්නපුබ්බක ඒ බෙහෙත් ගෙනැවිත් තම පුතාට පොවනවා. ලෙඩේ වැඩි වුණා. මරණාසන්න වුණා.

ලෙඩාව බලන්න අහළ පහළ උදවිය ගෙදර ආවොතින් දේපොල වස්තුව දකීවි යන බියෙන් ගෙයි පිළිකන්නේ ලෑලි ඇඳක පුතාව නිදි කෙරෙව්වා. එදා මරණාසන්න වේදනාවෙන් පෙලුණු මේ දරුවා පින්වන්ත කෙනෙක් බව බුදුරජාණන් වහන්සේ දිවැස් නුවණින්

දැක්කා. දැකලා ඒ දරුවා දෙසට බුදු රැස්මාලාවක් එව්වා. බිත්තිය පැත්තට හිස දමා හාන්සිවී සිටි මට්ටකුණ්ඩලී ඒ රැස්මාලාව දැක්කා. හිස හරවා බැලුවා. එසේ බලද්දී කරුණාබර දෑස් ඇති බුදුරජාණන් වහන්සේව තමයි මට්ටකුණ්ඩලීට දකින්න ලැබුණේ. මට්ටකුණ්ඩලීට හරි සතුටුයි.

'මට තාත්තා සැළකුවෙත් නැහැ. ගෙදර කවුරුවත් ආදරය කළෙත් නැහැ. අනේ ඒත් මං අමාරුවෙන් ඉන්න වෙලාවේ බුදුරජාණන් වහන්සේ මාව බලන්න වැඩියා. උන්වහන්සේ මං වගේ පොඩි දරුවන්ට කොයිතරම් ආදරේද! අනේ.... සාදු! සාදු!! මමත් බුදුරජාණන් වහන්සේට තමයි ආදරේ. බුදුරජාණන් වහන්සේ ළඟ මට හැමදාම ඉන්න ඇත්නම් කොයිතරම් හොඳද...'

මට්ටකුණ්ඩලී හැම දුකක්ම අමතක කරලා හරිම සතුටු සිතින් සිටියා. අම්මාට තාත්තාටත් මෙත් සිත වැඩුවා. සතුටු සිතින් මිය ගියා. දිව්‍ය කුමාරයෙක් වෙලා දෙව්ලොව උපන්නා. බුදුරජාණන් වහන්සේ ඒ ගැන ගාථාවකින් වදාළේ මෙහෙමයි.

**02.2. මනෝපුබ්බංගමා ධම්මා - මනෝසෙට්ඨා මනෝමයා**
**මනසා චේ පසන්නේන - භාසති වා කරෝති වා**
**තතෝ නං සුඛමන්වේති - ඡායාව අනපායිනි**

කරන සියලු පින පවටම - සිත මුල් වෙනවා හැම විට
පෙරටම එනවා ඒ සිත - සිතෙන් හැදෙනවා සියල්ල
කෙනෙක් පහන් සිතින් යුතුව - වචනෙන් පින් කරනා විට
යහපතටම යොදවා සිත - කයෙනුත් පින් කරනා විට
පල දෙනවාමයි ඒ පින - එනවා සැප ඔහු පසුපස
තමාව අත් නොහැර ළඟින් - සිටිනා සෙවණැල්ල විලස

ඉතින් පින්වතුනේ, පින්වත් දරුවනේ, මට්ටකුණ්ඩලී මැරුණාට පස්සේ තමයි ලෝභ තාත්තාගේ ඇස් දෙක ඇරුණේ. එයා සොහොනට ගිහින් පුතා ගැන සිහි කර කර අඬනවා. මට්ටකුණ්ඩලී දිව්‍ය කුමාරයාට මෙය දිවැසින් දැකගන්න ලැබුණා.

'අනේ මේ මගේ තාත්තා නේද! මං අසනීපව සිටිද්දී මට ආදරේ කළේ නැහැ. මං මැරුණාට පස්සේ අඬනවා. මෙයා නුවණැති කෙනෙක් කරන දෙයක් නොවෙයි කරන්නේ. තාත්තා මට ආදරේ නැතුවට මං තාත්තාට ආදරෙයි. තාත්තාට නුවණ ලබා දීලා පින් කරන්න පුරුදු කළොත් ඒකෙන් පින් සිදු වෙන්නෙත් මට මයි" කියලා මට්ටකුණ්ඩලී දිව්‍යපුත්‍රයා එදා සොහොනේ පැත්තකින් වාඩිවෙලා ඉකි ගස ගසා ඇඬුවා. අදින්නපුබ්බකට සොහොනේ අඬන දරුවෙකු දකින්න ලැබුණා. ඉතින් ඔහු මේ දරුවා ළඟට ගියා. ආදරයෙන් කතා කළා.

"අනේ පින්වත් ලස්සන පුතේ, ඇයි ඔයා ඔය අඬන්නේ? ඔයා ඉල්ලන ඕනම දෙයක් දෙන්නම්."

"අනේ මාමේ, මගේ කරත්තයට රෝද දෙකක් ඕන. ඒක නැතිකමටයි මං අඬන්නේ."

"අයියෝ පුතේ, ඒක සුළු දෙයක් නෙ. මට පුළුවනි ඔයා කැමති නම් රත්තරනින් හරි, රිදියෙන් හරි ලස්සන රෝද දෙකක් හදලා දෙන්න."

"එපා...! එපා...! මට ඕන ඒ රෝද නොවෙයි. ඉරත් හඳත් දෙක තමයි මං කැමැති රෝද දෙක."

අදින්නපුබ්බකට හිනා ගියා. "හොහ් හෝ ... මෝඩ දරුවෝ, ඔයාට තේරෙන්නේ නැද්ද? ඔය ඉර හඳ දෙක රෝද හැටියට ගන්න පුළුවන්ද?"

"මමද මෝඩ? මාමද මෝඩ? මම අඬන්නේ ඇස් දෙකට පෙනෙන දෙයක් ඉල්ලලයි. ඔයා අඬන්නේ ඇස් දෙකට නොපෙනෙන

දෙයක් ඉල්ලල යි. ඉතින් මමද මෝඩ?"

අදින්නපුබ්බක කල්පනාවට වැටුණා. පුදුම හිතුණා. 'මේ ළමයා හරි නුවණක්කාරයෙක්. මගේ යහපතටමයි මේ ඇවිදින් ඉන්නේ....'

"අනේ පුතේ, ඔයා කවුද?"

ළමා වේශය නැති වෙලා දිව්‍ය කුමාරයෙක් පෙනී සිටියා.

"තාත්තේ, මං මට්ටකුණ්ඩලී. මාව බේරගත්තේ බුදුරජාණන් වහන්සේ. ඉතින් තාත්තාත් බුදුරජාණන් වහන්සේව සරණ යන්න. ඔය හැඬීම නවත්වලා, තියෙන මිළ මුදල් වියදම් කරලා, පොඩි දරුවන්ට උදව් කරන්න. නැති බැරි අයට පිහිට වෙන්න. වෙහෙර විහාර හදන්න. එතකොට තාත්තටත් පින් රැස් කරගෙන සැප ලබන්න පුළුවන්. ලෝභකම කියන්නේ කිලුටක්මයි. ඒ නිසා ලෝභකම දුරු කරන්න."

පින්වතුනේ, පින්වත් දරුවනේ, ඊට පස්සේ ඒ තාත්තා මහා දානපතියෙක් වුණා. ගොඩාක් පින් රැස් කරගත්තා. පින්වන්ත දරුවකුට මොන තරම් හොඳ දේවල් කරන්න පුළුවන්ද?



# සෙනෙහෙබර
# ආමන්ත්‍රණය

# ආදරණීය දුවේ... පුතේ...

දයාබර දරුවනි, ජීවිතය යහපත් කර ගැනීමට, සුන්දර කර ගැනීමට ඔබ දරන උත්සහයට මහත් අස්වැසිල්ලක් ගෙන දෙන දයාබර කැපකරු දෙමාපියන් ඔබ වෙනුවෙන් එවූ තවත් සටහනක්...

*නමෝ බුද්ධාය !*

*සංජුක පුතුන් වෙත මෙත් සිතින් ලියමි,*

*නුදුටු නුඹ වෙනුවෙන්, මා දැඩි වෙහෙස දරමින් ඉතාමත් යහපත් ලෙස දරුවන්ට අකුරු උගන්වා ලබන වැටුපෙන් මුදලක් වෙන් කරන්නට ලැබීම මා ලද මහත් පිනකි. දැයේ පිනට පහළ වූ පින්වත් ලොකු ස්වාමීන් වහන්සේ අපට මග නොපෙන්වූවා නම් මේ පින්කම කෙසේවත් මෙතරම් පලදායී අයුරින් සිදු නොවේ. එබැවින් දයාබර පුතේ, නුඹත්, මමත් ප්‍රථමයෙන් සැමවිට උන්වහන්සේට පුණ්‍යානුමෝදන කළ යුතු වේ.*

*භයංකාර වූ සසරක ගමන් කරන අප කළ කුසල්, අකුසල්, රැස්කළ පින් අනුව වර්තමාන දිවිය අපට ද ලැබී ඇත්තේ ය. අසරණකම කව්රුවත් විසින් අපට ලබා දුන්නක් නොව අප විසින් සසර පුරා සැරිසරමින් උපයාගත් දේයි. එබැවින් ලද මාහැගි මනුෂ්‍යත්වය ප්‍රයෝජනවත් ලෙස ගත කරන්නට හිතට ගන්න. මා ද බොහෝ කම්කටොළු විඳ ඇත. එහෙත් ඒ සියල්ලම අප ජීවිතයට ශක්තිමත් ඉනිමගක් කරගත යුතුවේ.*

*පුතුනි නුඹ කළ මාහැගි පින නම් පින්වත් කිරිබත්ගොඩ ඤාණානන්ද ස්වාමීන් වහන්සේගේ සෙවනේ වැඩෙන්නට ලද භාග්‍යය යි. එයින් නුඹට ගෞතම බුදුරජාණන් වහන්සේගේත්, ශ්‍රී සද්ධර්මයේත්, සංඝයා වහන්සේලාගේ ඇසුරේත්, රැකවරණයත් ලබන්නට ඉඩ ලැබී ඇත. දයාබර පුතේ මනුෂ්‍ය ජීවිතය ජයගනන්නට*

හොඳින් අධ්‍යාපන කටයුතු කරන්න, සසර ජයගන්නට හැකි සෑම තප්පරයකම තෙරුවන් ගුණ ම සිහි කරමින්, පන්සිල් රකිනා දරුවෙකු වන්න.

මේ තරම් කාලයක් නුඹව ඇමතීමට පමා වීම පිළිබඳ අනේකවාරයක් සමාව අයැද සිටිමි. නුඹව දකින්නට මහත් වූ උවමනාවක් ඇතිමුත් ඇතිවෙන දුෂ්කරතා හමුවේ එය තවමත් කළ නොහැකි විය. ඔබට හැකිනම් නුඹගේත්, පවුලේ අයගේත් ඡායාරූපයක් එවන්නේ නම් එය ඉතා අගනේය.

දයාබර පුතේ, පුංචි පාඩමක් නමුත් අනර්ඝ වූ පාඩමක් ඇත. එනම් ඔය පුංචි වයසට බොහෝ සේ මඟ වරද්දන්නා වූ පාප මිත්‍ර ඇසුරෙන් වෙන් වී කළණ මිතුරන් ඇසුරු කිරීමයි. එය දැඩි සේ සිත්හී තබාගන්නා මෙන් නුඹෙන් ඉල්ලමි.

අ.පො.ස. සා/පෙළ මහ ඉහළින් සමත් වී උ/පෙළ ජයගන්නටත් ඉන්පසු විශ්ව විද්‍යාලය දක්වාම අධ්‍යපන කටයුතු සිදු කරන්නටත් හැකි සෑම උපකාරයක් ම කරන්නෙමි. ඉතින්, දයාබර පුතේ ඒ සියලු දේට මෙන් ම පුංචි මල්ලිගේත්, තාත්තාගේත් සියලු කටයුතු වෙනුවෙන් හැකි පමණ උපකාර කරන්න. හැකි සෑම විටම හැමට උපකාර කරන්න. මනුෂ්‍ය ජීවිතය ලැබී ඇත්තේ සේවය කිරීම සඳහා ද වේ.

ඒ සියලුම දේට, නුඹට තෙරුවන් සරණයි! සියලු දෙව් රැකවරණයත්, ශක්තියත්, ධෛර්යත් ලැබේවායි මෙත් සිතින් ප්‍රාර්ථනා කරමි.!

මෙයට,
දයාබර අම්මා සහ අප්පච්චි.

# ආදරණීය අම්මේ... තාත්තේ...

දරුවන්ගේ සිත් සතුටින් පිරී ඇත. ඒ ඔවුන්ට සෙනෙහෙවන්ත වූ තවත් අයෙක් මුණගැසුනු නිසාය. මේ දුවා දරුවන් යම් දිනෙක දී යම් තැනක සිටී ද ගුණයෙන් නුවණින් වැඩී සිටී ද, එදට ද ඔවුන් ඔබව මහත් සෙනෙහසකින් සිහි කරනු ඇති. ආදරණීය දෙමාපියනි, ඒ පින සසර කෙළවර කර ගැනීමට උපකාරයක් ම වේවා!

මේ අකුරු වී ඇත්තේ තවත් සෙනෙහෙවන්ත හැඟීමකි.

*නමෝ බුද්ධාය !*

*ආදරණීය කැපකරු දෙමාපියන් වෙත ස්තූතිපූර්වකව ලියමි.*

*ආදරණීය අම්මේ, තාත්තේ, ඔබලා සුවෙන් ද? ඔබ සුවෙන් පසුවෙතැයි මා සිතමි. ඉමක් කොනක් නොපෙනෙන මේ මහා සංසාරය තුළ උතුම් වූ මිනිසත් බව ලබන්නට තරම් ඔබත් මාත් බෙහෙවින් ම පිං කොට තිබේ. මින් පෙර කවර ආත්මභාවයක දී මා ඔබගේ ම සෙවනෙහි ඔබගේ ම පුතෙකුව, ඔබගේ සෙනෙහස ආදරය ලබමින් කල් ගෙවන්නට ඇතැයි විටෙක මට සිතේ. ඔබ මා කාගේ කවුරුන්දැයි වත් හරිහැටි නොදැන මෙලෙසින් යළි හමුවන්නේ ඒ සාංසාරික බැඳීම නිසා විය හැකිය. මෙලෙසින් ඔබ කරන මේ මහා උපකාරයට මා මහත් ණයගැති වෙමි.*

*ඉතින් අම්මේ, තාත්තේ, මෙලෙසින් ඔබගේ සෙනෙහස උපකාරය ලබමින් මාගේ ජීවිතය සඵල කරගන්නට, මාගේ අහිංසක දෙමාපියන්ගේ බලාපොරොත්තු ඉටුකරගන්නට ඔබත් මමත් මෙලෙසින් හමුවන්නේ ශ්‍රද්ධා අධ්‍යාපනික ශිෂ්‍යත්ව වැඩසටහන නිසාවෙනි. එම නිසාම මාගේ ගෞරව පූර්වක ස්තූතියහා පුණ්‍යානුමෝදනාව ගෞරවණීය ලොකු ස්වාමීන් වහන්සේ ඇතුළු ශ්‍රද්ධා අධ්‍යාපනික ශිෂ්‍යත්ව වැඩසටහනට පුදකොට සිටින්නේ ඉමහත් ගෞරවයෙනි.*

දහස් වාරයක් නොව අනන්ත අප්‍රමාණයක් පුණ්‍යානුමෝදනා කිරීමට කැමැත්තෙමි. ඔබ දහදිය කඳුලු වගුරුවා මහන්සියෙන් ඉපයූ මුදලින් විශාල ප්‍රමාණයක් මා වෙනුවෙන් මෙලෙසින් කැපකරනා බැවිනි. අම්මේ, තාත්තේ, මම ඔබට පොරොන්දු වෙමි. ඔබගේ මේ පරිත්‍යාගයෙන් උපරිම ප්‍රයෝජන ලබමින් ඔබගේ විශ්වාසයත්, දෙමාපියන්ගේ අහිංසක බලාපොරොත්තුවත් සැමදා සුරකින බවට, මම සැමදා පොරොන්දු වෙමි. මම මහන්සි වී අධ්‍යාපන කටයුතු වල නිරතව උසස්පෙළ විභාගයෙන් විශිෂ්ඨ ප්‍රතිඵලයක් ලබන්නට සැමවිට වෙර දරමි.

දිනපතාම බුදුන් නැමැද ත්‍රිවිධරත්නයේ පිහිට ලබන්නට පුංචි කල සිටම මාගේ දෙමාපියන් මා හට හුරුකර තිබේ. බුදුන් නමදින සෑම විටම මම ඔබලා සිහිපත් කොට ප්‍රාර්ථනා කරන්නේ මෙවන් මහත් වූ පුණ්‍යකර්ම නැවත නැවතත් කරන්නට, සසර දුකින් එතෙරව නිවන් සම්පත් ලබන්නට ඔබට ශක්තිය, ධෛර්ය ලැබේවා! යන්නයි.

ආදරණීය අම්මේ තාත්තේ මෙතනින් මා අදට නවතිමි. ඔබට නිදුක් නිරෝගී වාසනාවන්ත ජීවිතයක් ගත කිරීමට ශක්තිය ධෛර්ය උදාවේවා! මා එකසිතින් ම පතමි. ඔබට දිගාසිරි....!

තෙරුවන් සරණයි !

මෙයට,

විශ්වාසී පුතු,

සඳුන්.

මව්තුමියනි දයාබර.....

| | |
|---|---|
| ඔබ තුළ ඇති ගුණ කව්කර | දෙන්න |
| මට දුන් සහයෝගය | අගයන්න |
| සැමදා නීරෝගී වී | වැජඹෙන්න |
| අවසර බැතියෙන් සුවය | පතන්න |
| අඳුරු මාවතට පහනක් | වීලා |
| දුන් සහයෝගය නොයයි | මැකීලා |
| දහස් වතාවක් පින් ලැබ | දීලා |
| දිගාසිරි දෙමි කවියක් | වීලා |
| නිර්මල බුදු හිමි පිහිට | ලැබේවා! |
| දම් සරණින් බාධක දුරු | වේවා! |
| සඟ සරණින් නිති සතුට | රැඳේවා! |
| තුණුරුවනින් ලෙඩදුක් දුරු | වේවා! |

## නිර්මාණ ඉසව්ව

පැදියෙන් සිතුවමින් නිසඳැසින්
සුසැදි ඔබේ නිර්මාණ එකතුව

ඔබ කැමති ඕනෑම මාතෘකාවක් ගැන කවි, නිසඳැස්, කෙටිකතා, චිත්‍ර ආදී ඕනෑම නිර්මාණයක් ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්ව අංශය වෙත යොමු කරන්න.

ශ්‍රද්ධා සමාජ සත්කාර අංශය,
නො. 369, හේවාගම, කඩුවෙල.
www.shraddha.lk
charity@shraddha.lk

මගේ ආදරණීය කැපකරු දෙමාපියනි,

පිපුණු කුසුමක සුමුදු පෙති මෙන්
ඔබේ දිවිමග දියුණු වේවා...
දුකක් නොරැඳුනු සතුට සපිරුනු
දිනක් ඔබ හට උදා වේවා...
කෙනෙකුගේ දුක දැනෙන ඔබේ සිත
සදාකල්හිම පහන් වේවා...
සදා නොමියෙන ඔබේ සෙනෙහස
හදේ පත්ඉරු මත රැඳේවා...

ගිනියම් වූ මහා කතරක
ඉරිතැලී ගිය පොළවක
වියළෙමින් මියැදෙන්න ගිය බිජුවකට
පැන් පොදක් විය ඔබ
අතපතර විහිදී ගිය
හරිත වර්ණ සපිරි
මහා වෘක්ෂයක
උදාවට පණ දුන්
මේ ගෞරවය සදා ඔබටම වේවා !



# හොඳම යහළුවන් වෙමු

නමෝ බුද්ධාය!

ආදරණීය දුවේ, පුතේ,

අම්මා, තාත්තා, සහෝදර සහෝදරියෝ වගේ ම අපි කාගෙ කාගෙත් ජීවිතවලට බොහොම සමීප වන පිරිසක් තමයි යාළුවෝ කියන්නේ. ඔයාලටත් යාළුවෝ ඉන්නවා නේ ද? පුංචි පංතිවල ඉඳන් ම අපට ඇසුරට යාළුවෝ ලැබෙනවා. අම්මා, තාත්තා, සහෝදර සහෝදරියෝ කියන නෑදෑකම් අපට මේ ජීවිතය පුරා ම වෙනස් නො වුණාට ජීවිතයේ ඇසුරට එකතු වන යාළුවෝ නම් කලින් කලට වෙනස් වෙනවා.

අද අපි දුවලා පුතාලට කියා දෙන්න හිතුවේ හොඳ යාළුවෝ වෙන්නේ කොහොමද කියලයි. ඇසුරට හොඳ යාළුවෙක් වීම ගැන කියන්න කලින් ඔයගොල්ලන්ට අසිරිමත් යාළුකමක කථා පුවතක් කියලා දෙන්න අපි කැමතියි.

දුවේ පුතේ, මේ සිදුවීම සිදු වුණෙත් බුද්ධ ශාසනයක. හැබැයි ගෞතම සම්බුද්ධ ශාසනයේ නම් නෙවෙයි. අපගේ ශාස්තෘ වූ ගෞතම සම්මා සම්බුදුරජාණන් වහන්සේට පෙර ලොව පහළ වූ කාශ්‍යප සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ බුද්ධ ශාසනයේ දී යි මේ සිද්ධිය වුණේ. දුවලා පුතාලා සමහර විට මේ පුවත අහලත් ඇති. අහල නැති නම් දැනගන්නටත්, අහලා තියෙනවා නම් ඒ අසිරිමත් යාළුකම ගැන සිත පහදවා ගන්නටත් උපකාරයක් මෙයින් ඔයාලට ලැබේවි.

කාශ්‍යප සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ සම්බුද්ධ ශාසනයෙන් ධර්මයේ අනුග්‍රහ ලබපු, ඒ වගේ ම බොහොම හිතවත් ව සම්බුද්ධ ශාසනයට උපකාර කළ සම්බුද්ධ ශ්‍රාවකයෙක් හිටියා. ඔහුගේ අම්මාගෙත්, තාත්තගෙත් ඇස් පෙනෙන්නේ නැහැ. දෙදෙනා ම අන්ධයි. මේ අන්ධ දෙමව්පියන් ව ආදරයෙන් රැක බලා ගත්තේ, උපස්ථාන කළේ, හැම සත්කාරයක් ම කළේ මේ පුතා. ඔහු නමින් ඝටීකාර. රස්සාව විදිහට කළේ වළං හදන එක. කුඹල්කරුවෙක්,

දුවේ පුතේ, මේ ඝටීකාර කුඹල්කරුවා කාශ්‍යප සම්බුදු සසුනේ දී ම සතර අපායේ දොරටු වහලා දැම්මා. සතර අපායෙන් විතරක් නෙවෙයි, මනුෂ්‍ය ලෝකයෙනුත්, දිව්‍ය ලෝකයෙනුත් නිදහස් වුණා. ඒ විතරක් නෙවෙයි, ආයේ කිසි ම උපතකට නො එන කෙනෙක් ලෙසින් බ්‍රහ්ම ලෝකයේ ඉපදෙන්න සුදුසුකම් සපුරා ගත්තා. ඒ කියන්නේ දුවේ පුතේ මේ ඝටීකාර කුඹල්කරුවා කාශ්‍යප සම්බුදු සසුනේ දී අනාගාමී ශ්‍රාවකයෙක් බවට පත් වුණා.

ඝටීකාර කුඹල්කරුවාට හිටිය හොඳ ම යහළුවගේ නම ජෝතිපාල. ජෝතිපාල කියන්නේ බ්‍රාහ්මණ වංශිකයෙක්. කුලභේදය කියන දේ ඒ කාශ්‍යප සම්බුද්ධ ශාසනයේ දීත් දඹදිව බොහොම ප්‍රකට ව තිබුණා. ඒ වුණත් ඒ කුල භේදය මේ දෙන්නාගේ යාළුකම්වලට කිසි ම බාධාවක් වුණේ නෑ. කුල ගෝත්‍රවලින් අහසට පොළව වගේ දුරස්ථ වුණත් ඝටීකාරත්, ජෝතිපාලත් හිතවත්කමින් සමීපයේ ම යි හිටියේ.

දුවේ, පුතේ, අපේ හිතමිතුරුකම් බොහොම සාර්ථක වෙන්නේ අපේ තියෙන සමානකම් එක්කයි. එක වගේ හිතන, එක වගේ කටයුතු කරන පිරිස් බොහොම පහසුවෙන් එකිනෙකා අතර මිතුරුකම් ගොඩනගා ගන්නවා. ඒ වගේ ම ඒ හිතමිතුරුකම් බොහෝ කාලයක් බිඳ නො වැටී පවතිනවා. මේ ඝටීකාරත්, ජෝතිපාලත් දිගු කාලයක් මිතුරන් ලෙසින් ඇසුරු කළේ සමානකම් දෙදෙනා තුළ තිබුණ නිසයි. හැබැයි මේ දෙදෙනා අතරේ කැපී පෙනෙන ලොකු වෙනසකුත් තිබුණා. ඒ වෙනස තමයි, ඝටීකාර කාශ්‍යප සම්බුදු සසුනේ අනාගාමී උපාසකයෙක් වුණත් ඔහුගේ මිතුරු ජෝතිපාල කාශ්‍යප සම්බුදුරජාණන් වහන්සේ ව දකින්නටවත් කැමති නැති කෙනෙක් වීම.

දුවේ පුතේ, ඔයගොල්ලෝ සුදත්ත සිටුතුමා, ඒ කියන්නේ අනේපිඬු සිටුතුමා ගැන දන්නවා නේ ද? ගෞතම සම්මා සම්බුදු සසුනේ අග්‍ර දායකයා වුණේ එතුමා. ගෞතම සම්බුද්ධ ශාසනයේ

අනේපිඬු සිටුතුමාට හිමි වුණ ඒ උතුම් තනතුර කාශ්‍යප සම්බුදු සසුනේ දී හිමි වෙලා තිබුණේ ඝටීකාර උපාසකතුමාට. බලන්න, සම්බුද්ධ ශාසනයේ අග්‍ර දායකයා බවට තමන්ගේ යාළුවා පත් වෙලා තිබුණා වුණත් ජෝතිපාල මානවකයා තෙරුවන් සරණ ගිහින් හිටියේ නැහැ. හැබැයි, තමන්ට හිමි වුණ මේ මහා නිධානය සුන්දර ම තෑග්ගක් කරලා තමන්ගේ හොඳ ම, ප්‍රියමනාප ම මිතුරාට තිළිණ කරන්න ඝටීකාර උපාසකතුමාගේ හිතේ විශාල කැමැත්තක්, වුවමනාවක් තිබුණා. ඔහු කල් යල් බලමිනුයි සිටියේ ඒ සද්ධර්ම දායාදයෙන් යාළුකම අභිෂේක කරවන්නට.

එක දවසක් මේ දෙමිතුරෝ ස්නානය පිණිස ගංගාවට ගියා. ඒ නාන තොටුපළට සමීපයේ පිහිටි විහාරයක යි ඒ කාලයේ දී කාශ්‍යප සම්බුදුරජාණන් වහන්සේ වැඩ වාසය කළේ. ඝටීකාර උපාසකතුමා මෙහෙම හිතුවා.

'මගේ යාළුවා තවම තෙරුවන් සරණ ගිහින් නෑ. මගේ යාළුවාට මේ තිසරණයේ වටිනාකම පෙන්වලා දෙන්න මේක තමයි හොඳ ම අවස්ථාව. ඒ භාග්‍යවත් අරහත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ වැඩ ඉන්නේ නුදුරේ ම යි. කොහොම හරි මගේ යාළුවා ව උන්වහන්සේ සමීපයට එකතු කරන් යන්න ලැබුණොත්... සම්බුදුරජාණන් වහන්සේගෙන් ධර්මය අහලා ඒකාන්තයෙන් ම මගේ මේ නුවණැති යහළුවා බුද්ධ ශාසනයේ පිළිසරණ ලබාවි....'
මෙහෙම හිතපු ඝටීකාර උපාසකතුමා යාළුවා ළඟට ගියා. මෙහෙම කිව්වා.

"යාළුවේ, ඒ කාශ්‍යප සම්බුදුරජාණන් වහන්සේ වැඩ ඉන්නේ මේ ළඟ ම යි. අද අපි යමු උන්වහන්සේ ව බැහැ දකින්න..."
බමුණු මත කරපින්නාගෙන හිටපු, බ්‍රාහ්මණයන් හැර අන් සියල්ලන් පහත් යැයි සලකන්නට හුරු වී හිටපු ජෝතිපාල මානවකයා එයට දැඩි අකැමැත්ත ප්‍රකාශ කළා.

“මට ඕනේ නැහැ ඔය මුඩු ශ්‍රමණයෝ දකින්න යන්න. ඔබට උවමනා නම් ඔබ යන්න...”

හිතන්න, දුවේ පුතේ තමන් මහත් සේ ආදරය කරන, ගෞරව කරන, පුද සත්කාර කරන කෙනෙකුට මෙහෙම අවලාද නගනවා අසන්නට ලැබුණොත් අපට මොනවා හිතේවි ද? බොහෝ විට අමනාපයක්, තරහක්, ගැටීමක් ඇති වේවි. ඒත් සම්බුද්ධ ශාසනයේ මාර්ග ඵල ලබලා හිටපු, පටිඝය ඇති නො වන විදිහට ම දුරු කරලා හිටපු අනාගාමී උතුමෙකු වුණ ඝටීකාර උපාසකතුමාට යාළුවා ගැන ඇති වුණේ අනුකම්පාවක් ම විතරයි. නිහඬ ව ඒ උත්තරය භාර ගත්ත ඝටීකාර උපාසකතුමා තව ටික වෙලාවක් ගත වෙන්න හැරලා ජෝතිපාල මානවකයා හැඳ සිටි ඇඳුමෙන් ඇදලා තමන් සමීපයට ගත්තා. මෙහෙම කිව්වා.

“නෑ ජෝතිපාල... නුඹ අද යන්න ම ඕනි ඒ භාග්‍යවත්, අරහත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ ව මුණගැහෙන්න. උන්වහන්සේ මේ සමීපයේ ම යි වැඩ ඉන්නේ...”

ජෝතිපාල ඝටීකාර උපාසකතුමාගේ අත ගසා දැම්මා.
“මට බැහැ කිව්වනේ ඔය මුඩු ශ්‍රමණයෝ බලන්න යන්න. ඔබට ඕනි නම් ඔබ යන්න ඝටීකාර...”

මේ වගේ සිද්ධියක් අපට වුණා නම් දුවේ පුතේ, “මේ නම් පුදුම මුරණ්ඩු කෙනෙක්” කියලා එතැනින් ම අත්හැරලා දාවි. ‘එයාට වුවමනා නැති නම් මට මොකද?’ කියලා හිතලා පැත්තකට වෙලා හිඳීවි. ඒත්, යහළුවාගේ හිතසුව කැමති වුණ, යහළුවාට යහපතක් වනවා දකින්නට කැමති වුණ ඝටීකාර උපාසකතුමා එහෙම අත්හැරලා දැම්මේ නැහැ. ඒ වෙනුවට ඔහු කළේ දියේ ගිලෙමින් යළි එසවෙමින් නහමින් හිටපු ජෝතිපාල දියෙන් එසවෙන මොහොතක් බලලා ඔහුගේ කෙස් වැටියෙන් අල්ලා ගැනීමයි. කෙස්වලින් ඔහු ව ඉහළට ඔසවලා ඝටීකාර උපාසකතුමා මෙහෙම කිව්වා.

"නෑ ජෝතිපාල... නුඹ අද යන්න ම ඕනි ඒ භාග්‍යවතුන් වහන්සේ ව මුණගැහෙන්න..."

දුවේ පුතේ, මේ වෙලාවේ ජෝතිපාල මානවකයාගේ හිතේ පුදුමාකාර සිතුවිලි දහරක් හට ගත්තා. ඔහු තරහ සිතක් උපදවා ගත්තේ නැහැ. නුවණැති ඔහු මෙහෙම කල්පනා කළා.

'ඝටීකාර කිසි ම දවසක යහළුකම නිසාවත් කුලවත් වූ මගේ ඇඟට අත තබලා නැහැ... කුලහීන ඔහු මේ ආකාරයෙන් කිසි ම බයක් සැකක් නැතිව මගේ ඇඟට අත තිබ්බේ ඒකාන්තයෙන් ම මේ නම් දැකිය යුතු ම කෙනෙක් වෙන්න ඕනේ... මේ නම් නිසැකයෙන් ම ආශ්චර්යවත් කෙනෙක් වෙන්න ඕනේ... ඔව්... මම යන්න ඕනෙ ඒ සම්බුදුරජාණන් වහන්සේ ව මුණගැහෙන්න...'

ඉතින් ඝටීකාරත්, ජෝතිපාලත් දෙදෙනා කාශ්‍යප සම්බුදුරජාණන් වහන්සේ ව මුණගැහෙන්න ගියා. දුවේ පුතේ, "ඔය මුඩු ශ්‍රමණයෝ දකින්න මට බැහැ" කියලා වචනයෙන් කිව්වට මේ ජෝතිපාල මානවකයා වෙලා ඒ කාලයේ ඉපදිලා හිටියේ අපගේ ශාස්තෘ වූ ගෞතම සම්මා සම්බුදුරජාණන් වහන්සේ. ඊ ළඟ සම්බුද්ධ රාජ්‍යයේ බුද්ධරාජයාණන් වහන්සේ. ඒ බෝසතාණන් වහන්සේ තමයි යහළුවෙකුගේ පෙරැත්ත කිරීම මත ඒ ආකාරයෙන් කාශ්‍යප සම්බුදුරජාණන් වහන්සේ වෙත ඇවිත් ධර්මය අහලා සැදැහැ සිතක් උපදවාගත්තේ. ඊ ළඟ බුද්ධ රාජ්‍යයේ හිමිකරුවා එදා කාශ්‍යප සම්මා සම්බුදුරජාණන් වහන්සේ සමීපයේ පැවිද්ද ඉල්ලා සිටියා. පැවිදි ශ්‍රාවකයෙක් විදිහට බුද්ධ ශාසනය තුළ පිළිවෙතෙහි යෙදුණා.
අප මහබෝසතාණන් වහන්සේ සිද්ධාර්ථ ගෞතම කුමරුන් ලෙසින් විසි නව හැවිරිදි වියෙහි සිටිය දී ඇසළ පුර සඳ නැගුන රැයක අබිනික්මන් කරද්දී බ්‍රහ්ම ලෝකයේ උපත ලබා සිටි ඒ ඝටීකාර බ්‍රහ්මරාජයා මෙහෙම කල්පනා කළා.

'අද සිද්ධාර්ථ ගෞතම බෝසතාණන් වහන්සේ සම්බුද්ධත්වය සාක්ෂාත් කරන්නට අභිනිෂ්ක්‍රමණය කරනවා. ශ්‍රමණයෙක් බවට පත්

වනවා. උන්වහන්සේට ශ්‍රමණ පරිෂ්කාර වුවමනයි...'

දුවේ පුතේ, කාශ්‍යප සම්බුදු ශාසනයේ තමන්ගේ උපකාරයෙන් උතුම් පැවිද්ද ලැබූ යහළුවා වුණ ඒ බෝසතාණන් වහන්සේ අබිනික්මන් කළ මොහොතේ සිවුරු පිරිකර ආදි ශ්‍රමණ පරිෂ්කාර පූජා කරනු ලැබුවේ ඝටීකාර බ්‍රහ්මරාජයා විසින්. ආශ්චර්යවත් නැති ද මේ දෙමිතුරන්ගේ හිතමිතුරුකම?

මේ පින්බර හිතමිතුරුකම ගැන අපි ඔබට කියන්න හිතුවේ ජීවිත කාලයක් ම මතක තබා ගත යුතු සුන්දර අවවාදයක් සිහිපත් කරන්නයි. දුවේ පුතේ, ඔයගොල්ලො හොඳ යහළුවන් වෙන්න. එයින් ම ඔයාලට හොඳ යහළුවන්ගේ ලාභය ලැබෙනවා.

බලන්න, ඔයාලගේ යාළුවොත් ඇති පින් දහම්වලට ලොකු කැමැත්තක් නැති. ඒ වගේ ම අකීකරු, මුරණ්ඩු, බොහොම ඉක්මනින් තරහ එන, එකට එක කියන වගේ ම එකට එක කරන අය... ඒ විතරක් ද? ඔයාලට පොත් පත් දෙන්න අකැමැති, දන්න දෙයක් කියලා දෙන්න අකැමැති යාළුවොත් ඇති. දුවේ පුතේ ඒ යාළුවෝ මොන විදිහ වුණත් කමක් නෑ, ඒ හැමෝට ම ඔයාල ඝටීකාර උපාසකතුමා වගේ හොඳ යාළුවෙක් ම වෙන්න.

එදා කාශ්‍යප බුදුරජාණන් වහන්සේ ව මුණගැහෙන්න යන්න බෑ කියලා අදිමදි කළේ පින් නැති කෙනෙක් නෙමෙයි නේ ද? නුවණ නැති කෙනෙකුත් නෙමෙයි නේ ද? ඒ වනවිට දෙව් මිනිස් ලෝකයේ සිටි පින්වත් ම කෙනෙක්. නැණවත් ම කෙනෙක්. ඊ ළඟට සම්මා සම්බුද්ධත්වය ලබන්නට පුරන ලද පාරමිතා ඇති කෙනා තමයි " මුඩු ශ්‍රමණයෝ" කියමින් අවලාද නැගුවේ. ඒ කියන්නේ දුවේ පුතේ, බුද්ධ ශාසනයේ ලොකු පිහිටක් ලබන්නට පින තියෙන කෙනෙක් මේ ශාසනයට කිසි ම කැමැත්තක් නැති කෙනෙක් වගේ ඉන්න වුණත් පුළුවන් නේ ද? පින තියෙන කෙනා වුණත් ඒ පිනෙන් අග්‍ර විපාකයක් ලෙස බුද්ධ රාජ්‍යයක ශ්‍රාවකත්වය නො ලබා ම සැප විඳලා ඒ පින

ගෙවා දමන්නට ඉඩක් නැත්තේ නැහැ. ඒ නිසා දුවේ පුතේ, ගුණයෙන් නොවැඩුණ, දහමින් නොවැඩුණ ඔබේ යහළුවන්ට ඔබ ගුණයෙනුත්, දහමිනුත් වැඩෙන්න උපකාර කරන්න. ඔබට අසන්න ලැබෙන, පුරුදු කරන්න ලැබෙන සුන්දර ධර්ම කාරණය ඔබේ යහළුවන්ට කියා දෙන්න. ඒ යහළුවන්වත් සීලයේ ම සමාදන් කරවන්න. සම්බුද්ධ රාජ්‍යයේ ශ්‍රාවකයන් ගුණෙන්, නැණින් වැඩෙන කොට තමන්ගේ වගේ ම අන් අයගේත් ඒකාන්ත හිතසුව, යහපත කැමති වනවා කියන කරුණ සිදු වෙනවා ම යි.

යහළුවන්ගේ හිතසුව කැමැත්තෙන්, ඒ අයගේ යහපත වෙනුවෙන් මෛත්‍රී සිතින් ම, දයා සිතින් ම, කරුණාවන්ත සිතින් ම උපකාර කිරීමේ පුණ්‍ය විපාකයක් විදිහට දුවේ පුතේ ඔයාලට යහපත අයහපත පෙන්වා දෙන, කුසලය අකුසලය පෙන්වා දෙන කල්‍යාණ යහළුවන්ගේ උපකාරයන් නිරන්තරයෙන් ම සැලසේවි. ඔයගොල්ලෝ එහෙම කළොත් කළොත් තමයි මේ ශාසනයේ අන්තිම පුරුෂයන් බවට පත් නො වී සසුන් ප්‍රතිපදාවන් නො සිඳ පවත්වා ගන්නටත් ඔයාලට ඉඩ ලැබෙන්නේ. ඒ නිසා දුවේ පුතේ බුද්ධ ශාසනයක දී පමණක් ම මහරුත් ලබන්නා වූ උත්තම, පින්සාර හිතමිතුරුකම්වලින් ඔබත් ඔබේ යහළු පිරිවරට සෙත සුව සලසත්වා! එපින් බල මහිමයෙන් කලණ මිතුරු ඇසුරේ ඔබ නිතින් සුරැකෙත්වා! ඔබට සියලු යහපත වේවා!

තෙරුවන් සරණයි!

# පුණ්‍යක්‍රියා

(නිවැරදි පිංකමකට අත්වැලක්)

**'සුඛස්සේ තං භික්ඛවේ අධිවචනං යදිදං පුඤ්ඤං'**

මහණෙනි, පින යනු සැපයට කියන තවත් නමකි.

පින්වත් දරුවනේ, අපි කවුරුත් කැමති සැප ලබන්නයි. සැප විඳින්නයි. ඔයාලා අපි කවුරුත් කැමති නැහැ ලෙඩ වෙන්න, අනිත් අයගෙන් බැනුම් අහන්න, දඬුවම් ලබන්න, දුප්පත් වෙලා ඉන්න. එහෙනම් ඒ දේවල් තමයි දුක් කියන්නේ. කෙනෙක් ඒ වගේ දුක් විඳිනවා නම්, ඒ කෙනා පෙර ජීවිතවල පව් කරලා තියෙන කෙනෙක්. පස් පවු, දස අකුසල් කළොත් තමයි ඒ වගේ දුක් විඳින්න වෙන්නේ. එහෙනම් මොකක් ද දුකේ විරුද්ධ වචනය වෙන සැප කියන්නේ?

'සැප කියන්නේ පින ම යි, පින කියන්නේ සැපය ම යි' කියලයි භාග්‍යවතුන් වහන්සේ දේශනා කොට වදාළේ. ඒ කියන්නේ කෙනෙක් මේ ජීවිතේ සැප විඳිනවා නම් එයා පෙර ජීවිතවල පින් කළ නිසයි. තවත් කෙනෙක් දුක් විඳිනවා නම් ඒ, එයා පෙර ජීවිතවල දී පව් කළ නිසයි. පින නිසයි අපි මිනිස්සු වෙලා උපන්නේ. අපිට බුදුරජාණන් වහන්සේගේ ධර්මය අහන්න ලැබෙන්නේ. හොඳ, නරක, පින, පව අඳුනගන්න ලැබිලා තියෙන්නේ. පින් කළොත් විතරයි මේ ජීවිතේ වගේම ඊළඟ ජීවිතවල දිත් නිරෝගීව ඉන්න, අනිත් අයගෙන් ප්‍රශංසා, ගෞරව ලබන්න, සුවපහසු ජීවිත ගත කරන්න ලැබෙන්නේ. එහෙනම් පින නිසා ම දුර්ලභව ලැබුණු මේ අවස්ථාවේ අපි හැමවෙලාවක ම කරන්න ඕන පින් විතර ම යි. පින විතරයි නිවනට යන ගමනෙ දි අපිට පිහිටට තියෙන්නේ. අපේ ජීවිත සැපවත් කරන්නේ.

පින්වත් දරුවෝ අහලා තියෙනවානේ පස් පවු, දස අකුසල් ගැන. සිතෙන්, කයෙන් සහ වචනයෙන් සිද්ධ වෙන, මේ ජීවිතේ දීත් මරණෙන් පසු ජීවිතේ දීත් දුක් විපාක ලබා දෙන අකුසල්වලට තමයි පස් පව් සහ දස අකුසල් කියන්නේ. ඒ නිසා අපේ මෙලොව පරලොව ජීවිත සතර අපායට යොමු කරවන මේ අකුසල්වලින් අත්මිදිලා

පිනට, කුසලයට යොමුවෙලා, මේ ජීවිතෙත් පරලොව ජීවිතෙත් සැප විපාක ලබා ගන්නේ කොහොමද කියලා භාග්‍යවතුන් වහන්සේ අපට මනාව පෙන්වා දුන්නා.

එහෙනම් අපි මුලින්ම බලමු මොනවද මේ පස් පවු සහ දස අකුසල් කියන්නේ, ඒවා කළොත් ලැබෙන දුක් මොනවද කියලා.

දුක් විපාක ලබා දෙන පස් පවු

1. පාණාතිපාතය - සතුන් මැරීම.
2. අදත්තාදානය - අන්සතු දෑ සොරකම් කිරීම.
3. කාමමිථ්‍යාචාරය - වැරදි කාම සේවනය කිරීම.
4. මුසාවාදය - බොරු කීම.
5. සුරාමේරය - මත්වතුර, මත්ද්‍රව්‍ය භාවිතය.

දුක් විපාක ලබා දෙන දස අකුසල්

1. පාණාතිපාතය - සතුන් මැරීම.
2. අදත්තාදානය - අන්සතු දෑ සොරකම් කිරීම.
3. කාමමිථ්‍යාචාරය - වැරදි කාම සේවනය කිරීම.
4. මුසාවාදය - බොරු කීම.
5. පිසුනාවාචය - අන් අය බිඳවන කේලාම් කීම.
6. පරුසාවාචය - අසන්නට අකමැති සැර පරුෂ වචන කීම.
7. සම්ප්‍රප්පලාපය - හිස් වචන/ඕපදූප කතා කිරීම.
8. අභිද්‍යාව - අන්සතු වස්තුව සතු කරගැනීමේ දැඩි මසුරුකම.
9. ව්‍යාපාදය - අන් අයගේ විනාශය පතන දැඩි ද්වේෂය.
10. මිථ්‍යා දෘෂ්ටිය - වැරදි මත පිළිගැනීම.

මේ විදිහේ පස් පවු සහ දස අකුසල් කරන කෙනා මේ ජීවිතේ දී හැමෝටම අප්‍රිය වෙනවා. කිසි කෙනෙක් එයාව පිළිගන්නේ නැහැ. හිරේ විලංගුවේ වැටිලා දඬුවම් විඳින්නත් මරණෙන් පස්සේ සතර අපායේ වැටිලා බොහෝ කාලයක් දුක් විඳලා, විඳලා ආයෙමත් මනුස්සයෙක් වුණත් දුප්පත් වෙනවා. කන්න බොන්න, අඳින්න

පළඳින්න නැති වෙනවා. නෑදෑයෝ, හිතමිතුරෝ නැති වෙනවා. නිතර නිතර ලෙඩ වෙනවා. අඩු ආයුෂයෙන් මැරෙනවා. මේ වගේ තව බොහෝ දුක් විඳින්න සිද්ධ වෙනවා. ඒ නිසා අපි කවුරුත් මේ පස් පවු සහ දස අකුසල්වලින් අතමිදෙන්නට ඕන. ඒවා කරන්න හිතන්නවත් හොඳ නැහැ. හිතුවත් පවු රැස් වෙනවා.

එහෙනම් දැන් අපි බලමු මොනවද දස කුසල්, මොනවද ඒවා කළාම ලැබෙන සැප විපාක මොනවද කියලා.

සැප විපාක ලබා දෙන දස කුසල් කියන්නේ,
1. සතුන් නොමැරීම.
2. සොරකම් නොකිරීම.
3. කාමයේ වරදවා නො හැසිරීම.
4. හැම විටම සත්‍ය වචන කථා කිරීම.
5. අන් අයගේ සමගිය ඇති කරවන වචන කීම.
6. කවුරුත් අහන්නට කැමති ප්‍රිය වචන කතා කිරීම.
7. තමන්ටත් අනුන්ටත් අර්ථයක් ඇති දෑ කතා කිරීම.
8. හැම දෙයම අයිති කර ගැනීමේ දැඩි ආසාව අත්හැරීම.
9. සියලු සතුන්ගේ සැපය පතන මෛත්‍රියෙන් යුතු වීම.
10. නිවැරදි යහපත් මත පිළිගැනීම.

මේ විදිහට හැම පවකින් ම වැළකිලා කුසලයේ යෙදෙන කෙනා මේ ජීවිතේ දී හැමෝම අතර ප්‍රශංසාවටත් කීර්තියටත් පත්වෙනවා. හැම තැනක දී ම එයා පිළිගැනීමට, ගෞරවයට ලක් වෙනවා. සෝවාන් වුණොත් සතර අපායෙන් සදහටම නිදහස් වෙනවා. එහෙම නොවුණොත් මරණෙන් පස්සේ දිව්‍යලෝක, බ්‍රහ්මලෝකවල ඉපදිලා බොහෝ සැප සම්පත් ලබනවා. ආයෙමත් මනුස්සයෙක් වුණොත් ධනවත් පවුලක උපදිනවා. බොහෝ සැප සම්පත් ලබනවා. කායික මානසික නිරෝගී බව ලැබෙනවා. දීර්ඝායුෂ ලබනවා. ඒ වගේම උත්සහ කළොත් එයාට මාර්ගඵල පවා ලබන්නට හැකියාව ලැබෙනවා.
ඒ වගේම සූත්‍ර පිටකයේ අංගුත්තර නිකායේ පස්වෙනි පොත්

වහන්සේගේ පුඤ්ඤාභිසන්ද සූත්‍රයේ දී සැප ලබා දෙන, දිව්‍ය ලෝකයේ උපතට හේතු වෙන, ඉෂ්ට වූ, කාන්ත වූ, මනාප වූ, හිත සුව පිණිස පවතින පුණ්‍ය ගංගා අටක් ගැන භාග්‍යවතුන් වහන්සේ පෙන්වා දෙනවා. ඒ තමයි,

1. බුදුරජාණන් වහන්සේ සරණ යෑම.
2. ධර්මය සරණ යෑම.
3. ආර්ය මහා සංඝ රත්නය සරණ යෑම.
4. සතුන් මැරීමෙන් වැළකීම.
5. සොරකමින් වැළකීම.
6. වැරදි කාම සේවනයෙන් වැළකීම.
7. බොරුැ කීමෙන් වැළකීම.
8. මත්පැන් - මත්ද්‍රව්‍ය භාවිතයෙන් වැළකීම.

මෙතන දී බුදුරජාණන් වහන්සේ සරණ යෑම කියන්නේ අවබෝධයෙන් ම උන්වහන්සේගේ ගුණ සිහිකරගෙන සරණ යෑමයි. ධර්මය සරණ යෑම, ආර්ය මහා සංඝ රත්නය සරණ යෑම කියන්නෙත් ඒ වගේම ගුණ සිහි කරගෙන අවබෝධයෙන් ම සරණ යෑමයි. මේ ත්‍රිවිධ රත්නය සරණ යෑම කියන්නේ බොහෝ සැප විපාක ලබා දෙන, නිවනට උපකාර වෙන මහා කුසලයක්. ඒ නිසා පින්වත් දරුවෝ හැමෝම බුද්ධං සරණං ගච්ඡාමි, ධම්මං සරණං ගච්ඡාමි, සංඝං සරණං ගච්ඡාමි කියලා තෙරුවන් සරණ යනකොට හොඳට බුදුගුණ, දහම්ගුණ, සඟගුණ හිතෙන් සිහි කර කර සරණ යන්න ඕන.

ඒ වගේම යි පන්සිල් ආරක්ෂා කිරීම. දස කුසල්වල වගේම, මෙතනදිත් භාග්‍යවතුන් වහන්සේ පන්සිල් ආරක්ෂා කිරීම පෙන්වලා දෙනවා. එතකොට බලන්න දරුවනේ, සරණ යෑමයි, පන්සිල් ආරක්ෂා කිරීමයි අපිට මොන තරම් පිහිටක් ලබා දෙනවද කියලා.

ඒ වගේම අංගුත්තර නිකායේ පස්වෙනි පොත් වහන්සේගේ පුඤ්ඤකිරියවත්ථු සූත්‍රයේ දී භාග්‍යවතුන් වහන්සේ පෙන්වා දෙනවා පුණ්‍යක්‍රියාවලට මුල් වෙන දේවල් තුනක් ගැන. ඒ තමයි දානය මුල්

කරගෙන කරන පුණ්‍යක්‍රියාව, සීලය මුල් කරගෙන කරන පුණ්‍යක්‍රියාව, භාවනාව මුල් කරගෙන කරන පුණ්‍යක්‍රියාව.

මේ විදිහට දාන, සීල, භාවනා කියන ත්‍රිවිධ පුණ්‍යක්‍රියා මුල් කරගෙන පින් ස්වල්පයක් කළොත් ඒ කෙනා මරණින් පස්සේ මිනිසුන් අතර ඉපදෙනවා. ඒත් එයාට සැප ලැබෙන්නේ බෙහෝම අඩුවෙන්.

දාන, සීල, භාවනා කියන ත්‍රිවිධ පුණ්‍යක්‍රියා මුල් කරගෙන ප්‍රමාණවත් පරිදි පින් කළොත් ඒ කෙනා මරණින් පස්සේ මිනිසුන් අතර ඉපදිලා බොහෝ සැප ලැබෙනවා.

ඒ වගේම දාන, සීල, භාවනා කියන ත්‍රිවිධ පුණ්‍යක්‍රියා මුල් කරගෙන අධිකව පින් කළොත් ඒ කෙනා චාතුම්මහාරාජික, තාවතිංසය, යාමය, තුසිතය, නිම්මාණරති සහ පරනිම්මිත වසවත්ති කියන දිව්‍යලෝක හයෙන් එකක ඉපදිලා, දිව්‍ය ආයුෂයෙන්, සැපයෙන්, වර්ණයෙන්, යසසින්, අධිපතිභාවයෙන්, රූපයෙන්, ශබ්දයෙන්, ගන්ධයෙන්, රසයෙන් සහ පහසින් බලවත් වෙනවා.

ඒ නිසා පින්වත් දරුවනේ, අපි නිතර කරන්න ඕන මේ වගේ සැප විපාක ලබා දෙන, බොහෝ ආනිශංස ඇති පින්කම් විතර ම යි. සිතින් සිතන්නත් ඕන කුසල් සිතුවිලි විතරමයි. එහෙම කළොත් තමයි අපිට දුක් පීඩා කරදර, බාධක නැති සුන්දර සැපවත් ජීවිතයක් ගතකරන්නත්, ඉතා ඉක්මනින් ම සසර දුක් නිමා කරලා මේ සසර දුකෙන් නිදහස් වෙන්නත් පුළුවන් වෙන්නේ.

අන්න ඒ නිසා, ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්වලාභී පින්වත් දරුදැරියන්ගේ ජීවිත පිනෙන් පුරවාගන්න ඕන කරන අත්වැලක් දෙන්න මේ සැරේ ඉඳන් අපි පුණ්‍යක්‍රියා නමින් ලිපි පෙළක් ඉදිරිපත් කරනවා. ඉතා පහසුවෙන්, අඩු මුදලකින් හෝ මුදලක් වියදම් නොකර ඔයාලා හැමෝටම කරන්න පුළුවන් පින්කම් තමයි මේ ලිපි පෙළෙන් ඉදිරිපත් වෙන්නේ. පුංචි පුංචි මී මැස්සෝ මී පැණි බිඳෙන්

බිඳ එකතු කරලා මහා මී වදයක් හදනවා වගේ, ඔයාලට කරන්න පුළුවන් පොඩි පොඩි පින්කම් වලින් මහා පුණ්‍ය සම්භාරයක් එකතු කරගන්නත්, ඔයාලගේ අධ්‍යාපන කටයුතු සාර්ථක කරගන්නත්, ජීවිත සැපවත් කරගන්නත්, මේ සසර දුකෙන් නිදහස් වෙන්න යන ගමනේ පහසුව ඇති කරගන්නත් හැකියාව ලැබෙනවා නිසැකයි. ඔයාලා ඉගෙනගන්න මේ පින්කම් අනිත් යාළුවන්ටත් කියා දීලා ඒ අයත් එකතු කරගෙන පින්කම් කරන්න. එතකොට ලැබෙන ආනිශංස තවත් වැඩියි. ඔයාලගේ ජීවිතත් පිනෙන් පිරුණු ලස්සන ජීවිතයක් බවට පත් වේවා යි, කියලා අපි ආශිර්වාද කරනවා.

# මළුපෙත් ඇමදීම



ලස්සන සුවඳ මල් අරගෙන, සුදු වතින් සැරසිලා බෝධි වන්දනාවට, සෑ වන්දනාවට විහාරස්ථානයට යන විට බෝ මළුව, සෑ මළුව නැත්නම් විහාර මළුව කොළ වැටිලා අපිරිසිදු වෙලා තියෙනවා නම් ඔයාලටත් පුළුවන් එතන අතුගාලා ලස්සනට පිරිසිදු කරන්න. තමන් ඇමදපු මළුව දිහා බලාගෙන ඉඳලා සිහිය පිහිටුවාගෙන එක් ස්වාමීන් වහන්සේ නමක් රහත්භාවයටත් පත්වුණ බව බණ පොත්වල කියලා තියෙනවා. ඒ නිසා අපි කරන ඕනම පිංකමක් නියම පිළිවෙළට සිහි නුවණින් කළොත් ලැබෙන ආනිශංස මෙච්චරයි කියන්න බැහැ.

පුන් පෝය දවසකට පන්සලට ගියාම ඔයාලට දානය පූජා කරන්න, සිල් සමාදන් වෙන්න, භාවනා කරන්න, අනිත් අය කරන පින් අනුමෝදන් වෙන්න, බුදුරජාණන් වහන්සේට, සංඝයා වහන්සේට උපස්ථාන කරන්න, බණ අහන්න, ධර්මය සාකච්ඡා කරන්න වගේ බොහෝමයක් පින්කම් කරන්න පුළුවන්. ඉතින් අද අපි කියා දෙන්නේ

ඕනම වෙලාවක විහාරස්ථානයට ගියාම ඔයාලට පහසුවෙන් ම කරන්න පුළුවන් පින්කමක් ගැනයි.

ඔයාලා උදේට හවසට, ගෙදර මිදුල ඉදලෙන් පිරිසිදු කරනවාට කියන්නේ අතුගානවා කියලනේ. ඒත් පන්සලේ බෝ මළුව හරි, විහාර මළුව හරි, සෑ මළුව හරි පිරිසිදු කරනවාට, අතුගානවාට කියන්නේ 'අමදිනවා' කියල යි. ඒ මොකද, ඒ තැන්වල වැඩ ඉන්නේ අපේ බුදුරජාණන් වහන්සේ නිසයි. මළුපෙත් ඇමදීම කියන්නේත කිසිම වියදමක්, වැඩි මහන්සියක් නැතිව අපිට කරන්න පුළුවන් වටිනා පින්කමක්. එහෙනම් අද අපි ඔයාලට කියලා දෙන්නේත පෝය දවසේ සිල් සමාදන් වෙන්න පන්සලට ගියාම හරි, එහෙමත් නැතිනම් වෙන ඕනම දවසක බෝධි වන්දනාවට, සෑ වන්දනාවට පන්සලට යන පින්වත් ඔයාලට නිවැරදිව, පින් වැඩෙන විදියට බෝ මළුව, සෑ මළුව අමදින්නේ කොහොමද කියලා කියා දෙන්නයි.

මළුවක් අමදින්න නම් ඉරටු නො කැඩුණු හොඳ අලුත් ඉදලක් පාවිච්චි කරන්න ඕන. එතකොට තමයි මළුවේ කුණු රොඩු හොඳට ඉවත් කරලා, පිළිවෙළට අමදින්න පුළුවන් වෙන්නේ. ඒ වගේ ම, ගෙදර මිදුල අතුගානවා වගේ කලබලේට, එක එක දේවල් කල්පනා නොකර, දූවිල්ල ඇවිස්සෙන්නේ නැති විදිහටත සංයමයෙන්, හිත එක්තැන් කරගෙන, 'භාග්‍යවතුන් වහන්සේ වැඩ ඉන්න මළුවයි මම මේ අමදින්නේ' කියලා හිතාගෙන, බුදුගුණ ම සිහි කර කර මළුව අමදින්න මතක තියාගන්න. එතකොට බුද්ධානුස්සතියත් දියුණු කරන්නට පුළුවන් වෙනවා.

මළුවේ අතුරලා තියෙන වැලි එක පැත්තකට තල්ලු නොවෙන විදිහට කොළරොඩු විතරක් ඉවත් කරන්න පරිස්සම් වෙන්න. නැතිනම් නිතර අමදින කොට මළුවේ වැලි එක තැනකට ගොඩ ගැහිලා අපතේ යන්නට පුළුවන්. ඒ වගේම මළුවේ තණකොළ වැවිලා තියෙනවා නම් ඒවත් උදුරලා දමන්න ඕන. ගැඩවිලි පස් මතු වෙලා නම් ඒවත් ඉවත් කරන්න.

මේ විදිහට මළුවේ එක කෙළවරක ඉඳලා පොල් අතු රටාවෙන් හරි වෙනත් ලස්සන රටාවකින් පිළිවෙළට අමදින්න ඕන. එවිට යි ඒ පිංකමේ ලස්සන නිමාවක් දකින්න පුළුවන් වෙන්නේ.

ඔයාලා දන්නවද? සම්මජ්ජනීය සූත්‍රයේ දී අතුගා පිරිසිදු කිරීමේ ආනිශංස පහක් භාග්‍යවතුන් වහන්සේ පෙනවා දී වදාළා. ඒ තමයි,

1. තමන්ගේ හිත පහදිනවා.
2. දකින අයගේ හිත පහදිනවා.
3. දෙවියන් ද පහදිනවා.
4. අන් අයගේ ප්‍රසාදය තමන්ට වෙත ලැබෙනවා.
5. සුගතිගාමී පිනක් රැස් වෙනවා.

මීට අමතරව ධර්ම සංගායනාව කරපු මහරහතන් වහන්සේලා තවත් ආනිශංස දෙකක් පෙන්වා දෙනවා. ඒ,

1. බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව කළා වෙනවා.
2. අනිත් අයට යහපත් ආදර්ශයක් දුන්නා වෙනවා.

මළුව ඇමදලා අවසන් වුණාට පස්සේ ඔයාලට පුළුවන්, දෑත් පිරිසිදු කරගෙන සකස් කරගත් පූජාවන් භාග්‍යවතුන් වහන්සේටත් බෝධීන් වහන්සේටත් සෑරජාණන් වහන්සේටත් පූජා කරලා තමන්ගේ අතින් ම ඇමදලා ලස්සන කරපු මළුවේ වාඩිවෙලා බොහොම ශ්‍රද්ධාවෙන් භාග්‍යවතුන් වහන්සේගේ ගුණ සිහිකරමින් වන්දනා කරන්න. කරණීයමෙත්ත සූත්‍රය වගේ සූත්‍රයක් සජ්ඣායනා කරලා ටික වෙලාවක් මෛත්‍රී භාවනාවත් කරන්න. වන්දනා කරලා ඉවර වෙලා, කරපු හැම පිනක් ම සිහි කරගෙන දෙවියන්ටත්, මළගිය ඥාතීන්ටත් පින් අනුමෝදන් කරලා, තෙරුවන් කමා කරගෙන, මේ විදිහට ප්‍රාර්ථනා කරන්න.

''මා විසින් සිදුකළා වූ මේ මළුපෙත් ඇමදීමේ පුණ්‍යකර්මයෙන් රැස්වෙන පිනෙන්, කෙලෙස් කුණු දූවිල්ලෙන් අපිරිසිදු නොවී, ගෞතම බුදුසසුනේ තියත රැකවරණය ලබමින්, මේ දුක්ඛිත සසර ගමන ඉක්මනින් ම නිමා කරන්නට මටත්, මගේ දෙමව්පියන්ටත්, ගුරුවරුන්ටත්, නෑදෑ හිතමිතුරන්ටත්, වාසනාව උදා වෙත්වා! ''

බලන්න අපිට කිසිම වියදමක් නැතිව, මොන තරම් ලස්සනට පින් කරන්න පුළුවන්ද කියලා. එහෙනම් ඔයාලත් ඊළඟ දවසේ පන්සලට ගියාම මේ විදිහට බෝ මළුව, සෑ මළුව ඇමදලා, ශ්‍රද්ධාවෙන් වන්දනා කරලා ඔයාලගේ ජීවිතත් පිනෙන් පුරවගන්න උත්සහ කරන්න. ඒ මොකද මේ කරන පින් විතරයි හැමදාමත් අපේ ජීවිතවලට ආරක්ෂාව පිණිස පවතින්නේ.

තෙරුවන් සරණයි !

# පින් කරන්නා සැප ලබයි

පින්වත් දරුවනේ, සැප විඳින්න කවුරුත් කැමතියි. නමුත් සැප ලැබෙන ප්‍රතිපදාව මොකක්ද කියලා බොහෝ දෙනෙක් දන්නෙ නැහැ. ඒ නිසා පින් කරන්න කැමති වුණත්, පින්වලට උනන්දුවක් නැහැ. පින ගැන අවබෝධයක් තියෙනවා නම්, ඒ කෙනා දක්ෂ මල්කාරයෙක් වගෙයි. මල් නෙළන්නට මල් තියෙන තැන් සොය සොයා යනව වගේ පින් රැස්කරගන්නට පුළුවන් සෑම තැනකින්ම ප්‍රයෝජනය ගන්නවා.

චාතුම්මහාරාජික, තාවතිංස නමින් දිව්‍යලෝක දෙකක් තියෙනවා. ඒ දිව්‍යලෝක දෙකේම අධිපතිභාවය ලැබූ කෙනාට තමයි සක් දෙවිඳු කියන්නේ. සක් දෙවියන්, කලින් මිනිස් ලොව හිටිය

කෙනෙක්. ඔහු ගොඩාක් පින් කළා. දවසක් ලිච්ඡවි කුමාවරුන් සක් දෙවියන් ගැන බුදුරජාණන් වහන්සේගෙන් විමසා සිටියා . එවේලෙහි බුදුරජාණන් වහන්සේ සක් දෙවියන්ගේ අතීත ජීවිත කතාව මෙසේ පෙන්වා වදාළා.

**මඝ මානවක...**

එකමත් එක කාලෙක මගධ දේශයේ ‘මචල’ කියල ගමක් තිබුණා. මේ ගමේ තරුණයෙක් හිටියා. ඔහුගෙ නම මඝ. මඝ මානවකයා කියලයි ඔහු ප්‍රසිද්ධ වුණේ. ඔහු මිනිසුන්ට හරිම ආදරෙයි. හැමෝටම උදව් කරනවා. හැම දෙනාගෙම සැපදුක් බලනවා. ඒ වගේම ඔහු සිල්වන්තයි. ඔහු ජීවිත කාලය පුරාම උතුම් ගුණ ධර්ම හතක් සමාදන් වෙලා හිටියා. ඒ ගැන බුදුරජාණන් වහන්සේ මේ විදිහට පෙන්වා වදාළා.

“පින්වත් මහණෙනි, සක් දෙවියන් මිනිස් ලොව ජීවත්ව සිටියදී, උතුම් ගුණ ධර්ම හතක් සමාදන් වුණා. ඒ ගුණ ධර්ම හත නම් මේවා ය.

1. දිවි තිබෙන තුරා මම මව් පිය දෙදෙනාට ආදර භක්තියෙන් යුක්තව උපස්ථාන කරන කෙනෙක් වෙනවා.

2. දිවි තිබෙන තුරා මම වැඩිහිටියන්ට සලකන, ගුරුදෙගුරුන්ට සලකන, ආදර ගෞරව දක්වන
කෙනෙක් වෙනවා.

3. දිවි තිබෙන තුරා මම ඉතා යහපත් මුදු මොලොක් වචන කතා බස් කරන කෙනෙක් වෙනවා.

4. දිවි තිබෙන තුරා මම කේලාම් නොකියන කෙනෙක් වෙනවා.

5. දිවි තිබෙන තුරා මම ගිහි ගෙදර වාසය කරද්දී ලෝභ රහිත සිතින්

යුක්ත වෙනවා. දන් දෙන කෙනෙක් වෙනවා. මං ළඟට ඕනෑම කෙනෙක් යමක් ඉල්ලගෙන එනවා නම් ඒ ඉල්ලීමට සුදුසු කෙනෙක් වෙනවා. දන් දීම පිණිස අත් සෝදාගත්තු කෙනෙක් වෙනවා. දානය පිණිසම සිත යෙදවූ කෙනෙක් වෙනවා. ඉතා සතුටින් දන් දෙන කෙනෙක් වෙනවා. පරිත්‍යාග කරන කෙනෙක් වෙනවා.

6. දිවි තිබෙන තුරා මම සත්‍ය වචන කතා කරන කෙනෙක් වෙනවා.

7. දිවි තිබෙන තුරා මම ක්‍රෝධ සිත් නැති කෙනෙක් වෙනවා. යම් හෙයකින් මා තුළ ක්‍රෝධයක්, තරහක්, වෛරයක් හටගත්තොත් ඒ ක්ෂණයෙන්ම ඒ අකුසලය දුරුකරනවා. බැහැර කරනවා. නැති කරනවා.

මෙන්න මේ ගුණයෙන් යුතු මඝ මානවකයා තමයි සක් දෙවිඳු බවට පත්වුනේ. මේ ආකාරයෙන් ගුණ ධර්ම සතක් සමාදන් වෙලා එම ගුණධර්ම නොකඩා ආරක්ෂා කොට දියුණු කරගත්ත නිසා ඔහු ශක්‍ර දෙවියන් බවට පත්වුණා.

මනුලොව සිටියදී මහත් පින් රැස් කොට දෙව්ලොව උපන් මේ පින්වන්ත ශක්‍ර දෙවියන් හඳුන්වන නම් කීපයක්ම තිබෙනවා. ඒ ගැන බුදුරජාණන් වහන්සේ මේ අයුරින් වදාළා.

“පින්වත් මහණෙනි, ශක්‍ර දෙවියන්ට ‘මඝවා’ කියල කියනවා. එයට හේතුව ඔහු මඝ මානවකයන් ලෙස මිනිස් ලොව බොහෝ පින් කරමින් ගත කිරීමයි. ඒ වගේම ශක්‍ර දෙවියන්ට ‘පුරින්දද’ කියල කියනවා. එයට හේතුව මොහු මිනිස් ලොව සිටිද්දී සියලු දෙනාටම ආදර්ශ ඇතිවෙන පරිදි හැමටම ප්‍රථමයෙන් විවිධාකාරයෙන් දන් පැන් දීමයි. ඒ වගේම ශක්‍ර දෙවියන්ට ‘සක්ක’ කියනවා. එයට හේතුව මිනිස් ලෝකයේ සිටියදීත් මොහු ඉතාමත්ම පිළිවෙලකට, ඉතාමත් ක්‍රමානුකූල ලෙස හොඳින් සකස් කොට දන් පැන් පිදීමයි. ඒ වගේම ශක්‍ර දෙවියන්ට ‘වාසව’ කියල කියනවා. එයට හේතුව මිනිස් ලොව සිටියදී මොහු දුගී

දුප්පත් ජනතාවට නොයෙක් ආකාරයෙන් නිවාස තනවා පරිත්‍යාග කිරීමයි. ඒ වගේ ම ශක්‍ර දෙවියන්ට 'සහස්සක්ඛ' (දහසක් ඇස් ඇති කෙනා) කියනවා. එයට හේතුව ශක්‍ර දෙවියන්ට මොහොතකින් කරුණු දාහක් ගැන සිතන්නට පුළුවන්කමයි. ඒ වගේම ශක්‍ර දෙවියන්ට 'සුජම්පති' කියල කියනවා. සුජා කියලා අසුර කුමාරිකාවක් හිටියා. ඒ අසුර කුමාරිකාව ශක්‍ර දෙවියන්ගේ බිසව බවට පත්වුණා. ඒ නිසයි සුජම්පති කියන්නෙ. ශක්‍ර දෙවියන්ට 'දේවානමින්ද' කියල කියනවා. එයට හේතුව තව්තිසා වැසි දෙවියන්ගේ ප්‍රධානත්වයට පත්වෙලා සියලු යස ඉසුරින් පිරි දිව්‍ය රාජ්‍යයේ අධිපති බවට පත්වීමයි."

**රැස්කරනා පින එයි පසු පස්සේ...**

මෙයින් අපට එක දෙයක් පැහැදිලිව පෙනෙනවා. එනම් දෙදෙව්ලොවට අධිපති සක් දෙවිඳුන් බවට උපත ලබා සිටින්නේ මිනිස් ලොව සිටි මඝ නම් වූ තරුණයෙක් බවයි. මේ තරුණයා ඔය උතුම් ගුණ ධර්ම හත තුළ පිහිටලා මහත් සේවාවක් කළා. විශ්‍රාම ශාලා හැදුවා, පැන් පොකුණු හැදුවා, මංමාවත් හැදුවා. හොඳ දේවල්වලට විරුද්ධ අය ලෝකයේ හැමදාම ඉන්නවා. මඝ මානවකටත් සමහර අය විරුද්ධ වුණා. එයට හේතුව මඝ මානවකගේ සේවා කටයුතු නිසා අනිත් අයගේ ආනුභාවය අඩුවෙලා ගියා. මඝ මානවකගේ කීර්ති රාවය පැතිරිලා ගියා. නමුත් මඝ මානවක ඒ කිසිදු නින්දා අපහාසයකින් කම්පා නොවී තමන්ගේ සේවාව කරගෙන ගියා. තමන් යම් තැනක සේවාවක් කරමින් සිටිද්දී එතැනට බාධා කරනවා නම් එතුමා කාටවත් දොස් නොකියා එතැන අත්හරිනවා. වෙන තැනකට යනවා. මඝ මානවක එවැනි ආකාරයට තමන්ගේ පුණ්‍ය කටයුතු දිගින් දිගටම කරගෙන ගියා. තමන් සමාදන් වූ උතුම් ගුණධර්ම හත තුළ රැඳී සිටියා. ඒ හේතුව නිසාමයි ශක්‍ර දිව්‍යරාජයා බවට උපත ලැබුවේ.

**නැවත ඉපදීම...**

සක් දෙවිඳු බුදුරජාණන් වහන්සේ බැහැදකින්නට පැමිණෙනවා. දිනක් බුදුරජාණන් වහන්සේ ළඟ බණ ඇසූ සක් දෙවිඳුන් සෝවාන්

ඵලයට පත් වුණා. ඒ වගේම ඔහුගේ පින අවසන් වෙලා තිබුණ වෙලාවෙ ඒ ශක්‍ර දිව්‍ය තනතුරෙන් චුත වෙලා ඒ මොහොතේම යළිත් සක් දෙවිඳු බවට පත්වුණා. මේ සක් දෙවිඳුගේ අප්‍රමාදීව පුණ්‍ය සම්පත් රැස් කරගැනීමේ සමර්ථකම මතු කරමින් බුදුරජාණන් වහන්සේ මෙම ගාථාව වදාළා.

**අප්පමාදේන මඝවා - දේවානං සෙට්ඨතං ගතෝ**
**අප්පමාදං පසංසන්ති - පමාදෝ ගරහිතෝ සදා**

මඝ කුමරුන් නිරතුරු පින් කරමින් නොපමාවම පින් කෙරුව නිසා දෙව්ලොව දෙවියන් අතර රජුන් විය. මුල්ම තැනට ආවේ එනිසා නුවණැති උදවිය නිති පසසන්නේ හැමට උතුම් වූ නොපමාවයි ප්‍රමාද බව නම් ලොව නුවණැතියන් සදාකල්ම ගරහනවාමයි.

දැන් දරුවනි, ඔබට හොඳට වැටහෙනවා ඇති. මඝ කුමාරයා මොන තරම් යහපත් දේවල් පුරුදු කරපු කෙනෙක්ද. පින් නිසාමයි එබඳු අදහස් කෙනෙකුගේ සිතට පහළ වන්නේ. සමහරුන්ට මේ වගේ ඉතාමත් ලස්සන අදහස් ඇතිවෙනවා. ඒ අදහස් වලින් සතුටු වෙලා මෙවැනි, මෙවැනි ගුණධර්ම මමත් ඇති කරගන්නවා කියලා කෑ ගහලා කියනවා. පිරිස මැද්දේ ආඩම්බරයෙන් කියනවා. නමුත් ඒ උදවියගේ ඒ ලස්සන අදහස් කතාවට විතරක් සීමා වෙනවා. ක්‍රියාවට නැංවෙන්නේ නෑ. එයට හේතුව ප්‍රමාදයයි. එහෙම නම් හිතේ ඇතිවෙන ලස්සන අදහස්වලින් පල ලබන්න නම්, ඒ කෙනා අප්‍රමාදීවෙන්න ඕන නේද? මඝ කුමාරයා අප්‍රමාදීව උතුම් ගුණධර්ම හතක් දිවි තිබෙන තුරාවට අඛණ්ඩව පුරුදු කරපු නිසා දෙවියන් අතර රජුන් බවට පත්වුණා.

**අපිත් නොපමාව පින් කරමු...**

මේ නිසා අප්‍රමාදී බව කියන්නෙ ලෝකයෙහි මනුෂ්‍යයන්ව ශ්‍රේෂ්ඨත්වයට පත්කරවන ප්‍රධානම බලවේගය යි. මේ ගැන බුදු, පසේබුදු, මහරහතන් වහන්සේලා මහත් ඉහළින් වර්ණනා කොට තිබෙනවා. බුදුරජාණන් වහන්සේ අප්‍රමාදය ගැන ඉතාමත් ලස්සන

උපමාවක් වදාළා. ලෝකයෙහි සෑම සත්වයෙකුටම තමන්ගේ පාදයේ යම් යම් ප්‍රමාණ තියෙනවා. ඒ නිසා මේ සත්වයන්ගේ පා සටහන් විවිධත්වයෙන් යුක්තයි. මේ සියලු සත්වයන් අතර ඇතාගේ පා සටහන ගොඩක්ම විශාලයි. මේ ඇතාගේ පා සටහන තුළට ඕනම සත්වයෙකුගේ පා සටහනක් ඇතුළු කරන්න පුළුවන්. බුදුරජාණන් වහන්සේ වදාළා "අප්‍රමාදය" කියන්නේ ඇතාගේ පා සටහන වැනි දෙයක් බවයි. ඇත් පියසටහන තුළට සියලු සතුන්ගේ පියවර සටහන් ඇතුළු කරන්නට පුළුවන් වගේම අප්‍රමාදය නම් වූ මේ එකම ගුණය තුළට සියලු ගුණධර්ම ඇතුළු කරන්න පුළුවන්. එනිසා අප්‍රමාදය නිසා ලොව ජයගත් ඒ සියලු උතුමන් නිරතුරුවම අප්‍රමාදයට ප්‍රශංසා කරනවා. උන්වහන්සේලාගේ අතින් ගැරහුම් ලබන්නේ ප්‍රමාදය යි.

බුදුරජාණන් වහන්සේගේ කාලයෙහි සිටි ජනතාවට නිතර නිතර අප්‍රමාදී බවෙහි අනුසස් අසන්නට ලැබුණා. ඒ වගේම ප්‍රමාදයට දොස් ලැබුණා. එනිසා ප්‍රමාදීව ජීවත් වෙන්න සැදැහැවත් උදවිය කැමති වුනේ නෑ. අප්‍රමාදීව සිල් රැක්කා. දන් පින් කම් කළා. බණ භාවනා කළා. පින් රැස්කර ගත්තා. අප්‍රමාදීව පින්කම් කළ නිසාම ඔවුන්ට දෙව්ලොව සැප ලැබුණා. එපමණක් නොවෙයි, උතුම් චතුරාර්ය සත්‍යය අවබෝධ කරගැනීමේ වාසනාව පවා උදාවුණා.

**ඉධ මෝදති පෙච්ච මෝදති**
**කතපුඤ්ඤො උභයත්ථ මෝදති**
**සෝ මෝදති සෝ පමෝදති**
**දිස්වා කම්මවිසුද්ධිමත්තනෝ**

මෙලොව සතුටු වෙන්නෙත් පින් කරගත් කෙනාමයි.
පරලොව සතුටු වෙන්නෙත් පින් කරගත් කෙනාමයි.
දෙලොවදී ම සතුටු වෙන්නෙත් ඔහුමයි.
තමන් විසින් කරගත්තු පිරිසිදු කුසල කර්ම දැකලා,
ඔහු සතුටු වෙනවා. සතුටින් පිනායනවා.

(ධම්මපදය)



# රහතන් වහන්සේලා වන්දනා කිරීම

සුඛිනෝ වත අරහන්තෝ - තණ්හා තේසං න විජ්ජති
අස්මිමානෝ සමුච්ඡින්නෝ - මෝහජාලං පදාලිතං

අනේජං තේ අනුප්පත්තා - චිත්තං තේසං අනාවිලං
ලෝකේ අනුපලිත්තා තේ - බ්‍රහ්මභූතා අනාසවා

පඤ්චක්ඛන්ධේ පරිඤ්ඤාය - සත්තසද්ධම්මගෝචරා
පාසංසියා සප්පුරිසා - පුත්තා බුද්ධස්ස ඕරසා

සත්තරතනසම්පන්නා - තීසු සික්ඛාසු සික්ඛිතා
අනුවිචරන්ති මහාවීරා - පහීනභයභේරවා

දසහංගේහි සම්පන්නා - මහානාගා සමාහිතා
ඒතේ ඛෝ සෙට්ඨා ලෝකස්මිං - තණ්හා තේසං හ විජ්ජති

අසේඛඤාණං උප්පන්නං - අන්තිමෝයං සමුස්සයෝ
යෝ සාරෝ බ්‍රහ්මචරියස්ස - තස්මිං අපරපච්චයා

විධාසු න විකම්පන්ති - විප්පමුත්තා පුනබ්භවා
දන්තභූමිං අනුප්පත්තා - තේ ලෝකේ විජිතාවිනෝ

උද්ධං තිරියං අපාචීනං - නන්දී තේසං න විජ්ජති
නදන්ති තේ සීහනාදං - බුද්ධා ලෝකේ අනුත්තරා'ති.

(පඨම අරහන්ත සූත්‍රයෙන් - සං.නි.03)

© 2016 All Rights Reserved. Shraddha Media Network. No : 369, Hewagama, Kaduwela. T.P : 0112 571 471 Fax : 0112 548 400